"විශිෂ්ට සේවාව තුලින් ගුණාත්මක අධ්‍යාපනයේ ප්‍රමුඛතාවයට"

# කලාප අධ්‍යාපන කාර්යාලය - අනුරාධපුර
# வலயக் கல்விக் காரியாலயம் - அநுராதபுரம்
# Zonal Education Office - Anuradhapura

මගේ අංකය / My No / எனது இல : උමැප/අනු/කලාප/පා/10/01/06
ඔබේ අංකය / Your No / உமது இல :
දිනය / Date / திகதி : 2024.03.26

**ගුරු සේවයේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම - 2023/2024**

විදුහල්පති මගින්,
2023/2024 ස්ථාන මාරු අපේක්ෂිත ගුරුභවතුන් වෙත,

උක්ත කරුණ සම්බන්ධව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ උමැප /අදෙ /පා /04 /05 හා 2023.10.26 දිනැති ලිපිය හා බැදේ.

02. ඒ අනුව වසර 05ක් එකම සේවා ස්ථානයක සේවය කළ ගුරුභවතුන් කලාප ගුරු මාරු මණ්ඩල නිර්දේශ මත පහත ලේඛනයේ දක්වා ඇති පරිදි ස්ථාන මාරු කර ඇත.

03. මෙම ස්ථාන මාරුව සම්බන්ධයෙන් අභියාචනා ඉදිරිපත් කරන්නේ නම්,2024.04.09 දිනට පෙර, විදුහල්පති මගින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරන්න.අභියාචනා ඉදිරිපත් කිරීමේ දී ප්‍රදර්ශනය කර ඇති ලේඛනයේ ඔබට අදාළ අනු අංකය අභියාචනයේ දකුණු පස ඉහළ කෙළවරේ සටහන් කිරීම අනිවාර්ය වේ.

04. ඉදිරිපත් කරන අභියාචනාවේ සඳහන් කරුණු සනාථ කිරීමට අදාළ සියලු ලිපි ලේඛන එම අභියාචනයට ඇමුණුම් කළ යුතුය.

05. අදාළ අභියාචනා කලාප කාර්යාලයේ පාලන 10 යු.ඩී.ඒ.වරුණි ශෂිකලා මිය වෙත ගෙනවිත් භාරදිය යුතු අතර, ඒ සමඟ ලබා දෙන ආකෘති පත්‍රය ද සම්පූර්ණ කර භාර දීමට කටයුතු කළ යුතුය.

06. අදාළ දිනට පසු භාරදෙනු ලබන අභියාචනා කිසිවක් භාර නොගන්නා අතර, අභියාචනා මණ්ඩල කැඳවා අවසානයේ සියලුම ගුරුභවතුන් සඳහා ස්ථාන මාරු ලිපි නිකුත් කරනු ලැබේ.

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
කලාප අධ්‍යාපන කාර්යාලය,
අනුරාධපුර.

මනේෂා මංජරිකා හෙට්ටිආරච්චි
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය I
කලාප අධ්‍යාපන කාර්යාලය,
අනුරාධපුර.

පිටපත:-

1. ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්,ප්‍රධාන අමාත්‍යාංශය,උතුරු මැද පළාත - කා.දැ.පි
2. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,උ.මැ.ප - කා.දැ.පි
3. ගණකාධිකාරී,කලාප අධ්‍යාපන කාර්යාලය,අනුරාධපුරය - දැ.පි හා අ.ක.ස
4. කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ - දැ.පි
5. පොදු ගොනුව.

කලාප අධ්‍යක්ෂ / Zonal Director / வலயக் கல்விப் பணிப்பாளர் - 025 2225332 (Fax)
පාලන අංශය / Admin Unit / நிர்வாகப் பிரிவு - 025 2223030 (Fax)
සැලසුම් අංශය / Planning Unit / திட்டமிடல் பிரிவு - 0252220214 (Fax)
සංවර්ධන අංශය / Development Unit / அபிவிருத்திப் பிரிவு - 025 2234807 (Fax)
ගිණුම් අංශය/වැටුප් / Account Unit / நிதிப்பிரிவு - 025 2234808 (Fax)
E mail - ncpanueducation@gmail.com
Web - www.anueducation.lk
Facebook - කලාප කාර්යාලය අනුරාධපුර
Official SMS Alert - ZEO_A.pura

CamScanner